# වාසනාවන්

# - පාඩම ඇසුරින් ක්‍රියාකාරකම්

<u>ආවරණය වන නිපුණතා මට්ටම්</u>

5.1 වාක් කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

9.3දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි.

සිංහල භාෂාව හා සාහිත්‍යය

6 වැනි ශ්‍රේණිය

# ක්‍රියාකාරකම් අංක 01

- පහත පද්‍යවල අර්ථ දී ඇත්තේ නිවැරදි පිළිවෙළට නොවේ.ඒවා නිවැරදි පිළිවෙළට ගළපා ලියන්න.

1. මල් රොනට බමරු වඩිනා
   ලිය මඩුළු නිඹද නිලනා
   ඇල්පවන ගිමන නිවනා
   නිල් දෙරණ වාසනාවන්

කෙළිදෙළෙන් ඉපිලී
පිහිනමින් නටන,
නොයෙක් දණ්ඩි
පැටවුන් සිටින, සිදී
නොයන දිය කඩිති ඇති,
මේ නිල්වන් භූමිය
වාසනාවන්ත ය.



2. ගල් කුළෙන් කුළට හැපෙනා
දුල් රිදී දියෙන් සොබනා
දිය කඳුරු ගලා බසිනා
නිල් දෙරණ වාසනාවන්



ගස් මුදුන්වල අඩුවක් නැතිව සිටිනබටිති මලිති ආදි කුරුල්ලන් මිහිරි හඬින් සින්දු කියන්නා වූ මේ නිල්වන් භූමිය වාසනාවන්ත ය.

3. තුරු සිරස අරා සිටිනා
සොඳ බටිති මලිති නොමිනා
යස මිහිරි සින්දු කියනා
නිල් දෙරණ වාසනාවන්



මල් රොන් ගන්නට එන බමරුන් සිටින,නිතර නිල් පැහැයෙන් යුතු වූ,ගිමන නිවන සිසිල් සුළඟ ද තිබෙන්නා වූ, නිල් පැහැයෙන් මේ භූමිය වාසනාවන්ත ය.

4. කෙළි මතින ඉපිළ පිහිනා
නෙක දණ්ඩි පැටව් නටනා
දිය කඩිති සිඳී නොයනා
නිල් දෙරණ වාසනාවන්



කඳු මුදුන්වලින් ගලා හැලෙන
රිදී පැහැයෙන් බබළන
අලංකාර දියදහරා සහිත
නිල් පැහැයෙන් යුතු මේ භූමිය
වාසනාවන්ත ය.

# ක්‍රියාකාරකම් අංක 02

- පහත පද සඳහා ගැළපෙන සමානාර්ථවත් පද තෝරා ලියන්න.

1. සිරස - ....................
2. ගිමන - ....................
3. කෙළි - ....................
4. ලිය මඬුළු- ....................
5. දෙරණ - ....................
6. නිබඳ - ....................
7. නෙක - ....................



# පිළිතුරු

- ක්‍රියාකාරකම් අංක 01

1. මල් රොනට බමරු වඩිනා..... - මල් රොන් ගන්නට එන බමරුන් සිටින............
2. ගල් කුළෙන් කුළට හැපෙනා....... - කඳු මුදුන්වලින් ගලා හැලෙන.......
3. තුරු සිරස අරා සිටිනා........ - ගස් මුදුන්වල අඩුවක් නැතිව සිටින්නා වූ.....
4. කෙළි මතින ඉපිළ පිහිනා ...... - කෙළිදළෙන් ඉපිලී පිහිනමින් නටන........

ක්‍රියාකාරකම් අංක 02

1. සිරස - .හිස...........
2. ගිමන - ..ග්‍රීෂ්මය....
3. කෙළි - ...ක්‍රීඩා..........
4. ලිය මඬුළු- .ලතාමණ්ඩප.....
5. දෙරණ - ..පොළොව........
6. නිබඳ - ..නිතර.........
7. නෙක - .....නොයෙක්........